# අයවැය හිඟය පියවීම සඳහා බදු හා බදු නොවන ආදායම්වල දායකත්වය

**එස්. ඒ. ඩී. යාමිණි**[1]

## සංක්ෂේපය

සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ප්‍රධාන ගැටලුවක් ලෙස අයවැය හිඟය පෙන්වා දිය හැකි අතර ඉහළ වියදම් මට්ටම් සමඟ පහළ ආදායම් මට්ටම් ජනිත වීම තුළින් ආදායම් හිඟය පැන නඟී. මෙම අයවැය හිඟය පියවීම සඳහා අවශ්‍ය ආදායම එම රජය විසින් බදු හා බදු නොවන ආදායම් ක්‍රම ඔස්සේ උපයා ගනී. මෙම අධ්‍යයනය ඔස්සේ සිදුකරනු ලබන්නේ, බදු හා බදු නොවන ආදායම් අයවැය හිඟය පියවීම සඳහා කොපමණ දායකත්වයක් ලබාදේ ද යන්න විමසා බැලීමයි. මෙහිදී අයවැය හිඟය පියවීමට බදු හා බදු නොවන ආදායම් කොපමණ දායකත්වයක් ලබාදේ ද යන්න විමසා බැලීම අරමුණු කොටගත් අතර එමගින් අයවැය හිඟය පියවා ගැනීමට වාර්ෂිකව සමත් වී ඇති ප්‍රමාණයන් විමසා බැලීමට ලක් කෙරුණි. එහිදී වසර 10ක බදු හා බදු නොවන ආදායම් දත්ත ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවන් පරිශීලනය කරමින් ද්විතීක දත්ත ලෙස යොදා ගන්නා ලදී. මෙලෙස ලබාගත් දත්ත සහසම්බන්ධතාවය, ප්‍රස්ථාර ආදිය ඔස්සේ තවදුරටත් විශ්ලේෂණය කරනු ලැබූ අතර එහිදී අයවැය හිඟය සහ බදු හා බදු නොවන ආදායම් ප්‍රතිලෝම සම්බන්ධතාවයක් හඳුනා ගත හැකි විය. ඒ අනුව බදු ආදායම එක් ඒකකයකින් වැඩි හෝ අඩු වන විට අයවැය හිඟය 0.0039කින් පමණ විචලනය වන බව හඳුනාගත හැකි විය. මෙයින් නිගමනය වනුයේ අයවැය හිඟය හා බදු හා බදු නොවන ආදායම් අතර දැඩි ප්‍රතිලෝම සම්බන්ධතාවයක් පවත්නා බවත් බදු හා බදු නොවන ආදායම් අයවැය හිඟය සඳහා සැලකිය යුතු බලපෑමක් සිදුකරන බවත් ය.

**මුඛ්‍ය පද :** අයවැය හිඟය, බදු හා බදු නොවන ආදායම්

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilekayamini94@gmail.com